# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 35 දරන
# බුද්ධ ශාසන අරමුදල පනත

---

[සහතිකය සටහන් කළේ 1990 සැප්තැම්බර් මස 26 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1990 සැප්තැම්බර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 90 යි තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 35 දරන බුද්ධ ශාසන අරමුදල පනත.

[සහතිකය සටහන් කළේ 1990 සැප්තැම්බර් මස 26 වන දින.]

එල්. ඩී.—ඕ. 44/89

**බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම සඳහා අරමුදල් එකතු කිරීම හා සම්පාදනය කිරීම උදෙසා "බුද්ධ ශාසන අරමුදල" නමින් අරමුදලක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1990 අංක 35 දරන බුද්ධ ශාසන අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

**2.** (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "බුද්ධ ශාසන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. බුද්ධ ශාසන අරමුදල පිහිටුවීම.

(2) එකී අරමුදල, (1) වන උපවගන්තියෙන් ඊට පවරා දෙන ලද නාමයෙන් සංස්ථාවක් වන අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් ඇත්තේ ය. තව ද ඒ සංස්ථාව විසින් පොදු මුද්‍රාවක් තබා ගනු ලැබිය හැකි අතර එකී සංස්ථාගත නාමයෙන් එය විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

**3.** (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මෙහි මින් මතු දක්වා ඇති විධිවිධාන පරිදි සම්පාදනය කරනු ලබන පාලක මණ්ඩලයක් වෙත පැවරෙන්නේ ය. අරමුදලේ පාලක මණ්ඩලය.

(2) (මෙහි මින් මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලේ පාලක මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වේ :—

(අ) ජනරජයේ ජනාධිපතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන, කැබිනට් මණ්ඩලයේ යම් සාමාජිකයෙක් ;

(ආ) පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ ද බුද්ධ ශාසන විෂය භාර කර ඇත්තා වූ ද අමාත්‍යවරයා ;

(ඈ) බුද්ධ ශාසන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඉ) මහා භාණ්ඩාගාරවරයා ; හා

(ඊ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙක්, මේ එක් එක් සාමාජිකයා වෙත ජනාධිපතිවරයා විසින් නිකුත් කරනු ලැබූ පත්වීමේ ලිපියෙහි නිශ්චිතව සඳහන් කාලපරිච්ඡේදයක් සඳහා, (3) සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ඔහු එම ධුරය දැරිය යුතු ය.

2—ඩී 009790—5,800 (90/08)

(3) ජනාධිපතිවරයා විසින් (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් සාමාජිකයකුගේ පත්වීම, ජනාධිපතිවරයා විසින් ස්වකීය පරම අභිමතය අනුව ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තියේ (ඊ) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ, මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් තමන් කැමති ය සඳහා ජනාධිපතිවරයා වෙත යවනු ලැබූ ලිපියක් මගින්, කවර වුව ද වේලාවක දී මණ්ඩලයේ තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එකී ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබූ විට ඒ ඉල්ලා අස්වීම ක්‍රියාත්මක වන්නේ ය.

(5) මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කරනු ලබන කටයුතු පිළිබඳ කාර්ය පරිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

(6) මණ්ඩලය විසින් කරනු ලැබූ යම් ක්‍රියාවක් හෝ කාර්ය පරිපාටියක්, මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ මණ්ඩලයේ සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් හේතු කොට ගෙන ම පමණක් අවලංගු වන්නේ යයි නොසැලකිය යුතු ය.

(7) ජනාධිපතිවරයා මණ්ඩලයේ සාමාජිකයකු නම්, ඔහු මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය. ඔහු මණ්ඩලයේ සාමාජිකයකු නොවේ නම්, ඔහු විසින් 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නම් කරන ලද තැනැත්තා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

උපදේශක කමිටුව.

4. (1) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන උපදේශක කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය :—

(අ) සියම් නිකායේ මල්වතු පාර්ශ්වයේ මහානායක ස්වාමින්ද්‍රයන් වහන්සේ ;

(ආ) සියම් නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහා නායක ස්වාමින්ද්‍රයන් වහන්සේ ;

(ඇ) ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ තත් කාලයේ සභාපති ධුරය දරන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ;

(ඈ) ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ;

(ඉ) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් අමාත්‍යාංශයේ ලේකම් ;

(ඊ) බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් ; සහ

(උ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් පස් දෙනෙක්.

(2) (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් මහා නායක ස්වාමීන් ද්‍රයන්වහන්සේලා විසින් තමන් වහන්සේලා අතුරින් කෙනකු උපදේශක කමිටුවේ සභාපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර, ඒ තෝරා පත් කර ගනු ලැබූ දින සිට අවුරුදු දෙකක් ධුරය දැරිය යුතු ය. තව ද සභාපති ධුරය සඳහා නැවත තෝරා පත් කර ගනු ලැබීමට ඒ ස්වාමීන් ද්‍රයන් වහන්සේ සුදුස්සකු විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකුගේ මියයාම, ඉල්ලා අස්වීම නිසා හෝ කලින් ධුරය හිස් කළහොත් හෝ ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස, වර්ෂ දෙකක කාලසීමාවක් සඳහා ඒ සාමාජිකයා තම ධුරය දැරිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු කිසිදු හේතුවක් නොදක්වා ජනාධිපතිවරයා විසින් කවර වේලාවක දී වුවද ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර එසේ ඉවත් කරනු ලැබූ තැනැත්තාගේ නොගෙවී ඇති ධුර කාලය සඳහා ඔහු වෙනුවෙන් වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත් කරනු ලැබූ, උපදේශක කමිටුවේ යම් සාමාජිකයකු විසින් ජනාධිපතිවරයා වෙත යවන ලද ලිපියක් මගින් කවර විටෙක දී වුවද මණ්ඩලයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ජනාධිපතිවරයා විසින් ලිඛිතව ඒ ලිපිය පිළිගනු ලැබූ විට ඒ ඉල්ලා අස්වීම බලාත්මක වන්නේ ය.

(6) උපදේශක කමිටුවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කරනු ලැබිය යුතු කටයුතු සම්බන්ධයෙන් වූ කාර්ය පරිපාටිය උපදේශක කමිටුව විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

උපදේශක කමිටුව විසින් මණ්ඩලයට උපදෙස් දීම සහ සහාය වීම කළ යුතු බව.

5. මණ්ඩලයේ බලතල පාවිච්චි කිරීම, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් වූ යම් කරුණක් කමිටුවේ සහාය සහ උපදේශ සඳහා කමිටුව වෙත යොමු කරනු ලැබූ විට, උපදේශක කමිටුව විසින් ඒ කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයට සහායවීම සහ උපදෙස් දීම කරනු ලැබිය යුතු ය.

අරමුදලේ කාර්යය.

6. විදේශීය වුවද දේශීය වුවද කවර වූ හෝ ප්‍රභවයකින් ලැබෙන මුදල් භාර ගැනීම සහ බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම අරභයා ඉතාමත්ම යෝග්‍ය යැයි මණ්ඩලය සලකන ආකාරයට සහ එසේ සලකනු ලබන කාර්ය සඳහා ඒ මුදල් යෙදවීම අරමුදලේ කාර්යය විය යුතු ය.

මණ්ඩලයේ බලතල.

7. මණ්ඩලයට පහත දැක්වෙන බලතල ඇත්තේ ය :—

(අ) චංචල හෝ නිශ්චල යම් දේපළක්, ත්‍යාගයක් වශයෙන්, ප්‍රදානයක් වශයෙන්, තෙස්තමේන්තු නියාදනයක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, දැරීම සහ කළමනාකරණය කිරීම ;

(ආ) අරමුදලට අයත් චංචල හෝ නිශ්චල යම් දෙයක් විකිණීම, උකස් කිරීම, බදුදීම, ප්‍රදානය කිරීම, පවරාදීම, පිත්ඨ-වරණය කිරීම, සතුකර දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීම ;

(ඇ) අරමුදලේ කාර්ය උන්නතිය සඳහා ප්‍රදානයන්, පරිත්‍යාග හෝ ශිෂ්‍යත්ව දීම ;

(ඈ) අරමුදලේ බලතල පාවිච්චි කිරීම, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා, සහ අරමුදලේ කාර්යයන් ඉටු කර ගෙන යෑම සඳහා අවශ්‍ය වන සියලු කොන්ත්‍රාත්තු වලට සහ ගිවිසුම්වලට කෙළින්ම හෝ තත් කාර්ය සඳහා මණ්ඩලය විසින් ලිඛිතව භාර දෙනු ලබන මණ්ඩලයේ නිලධරයන්, සේවකයන් හෝ අනුයෝජිතයන් මගින් ඇතුළත් වීම හෝ ඉටු කිරීම ;

(ඉ) බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම සඳහා ආයතන පිහිටුවීම සහ බුද්ධ ශාසනය ආරක්ෂා කිරීමෙහි සහ පෝෂණය කිරීමෙහි නිරතව සිටින ආයතන කළමනාකරණයෙහි ලා සහාය වීම ;

(ඊ) අරමුදලේ පරිපාලනයට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම ;

(උ) අරමුදලේ කාර්ය සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යෑම සහ වැසීම සහ අරමුදලේ දේපළ ඇපයට තබා හෝ ඇපයක් නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ; සහ

(ඌ) අරමුදලේ කාර්ය කරගෙන යෑමට ආනුෂංගික වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියාවන් සහ දේවල් කිරීම.

බුද්ධශාසන අරමුදල් ගිණුම.

8. "බුද්ධ ශාසන අරමුදල් ගිණුම" යනුවෙන් හඳුන්වනු ලබන ගිණුමක් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යා යුතු අතර පහත දැක්වෙන මුදල් ඒ ගිණුමට බැර කළ යුතු ය :—

(අ) දේශීය හා විදේශීය කවර වුවද ප්‍රභවයකින් ලැබෙන ප්‍රදානයන් වශයෙන් හෝ පරිත්‍යාග වශයෙන් අරමුදලට ලැබෙන සියලු මුදල් ;

(ආ) අරමුදල විසින් කරනු ලැබූ ආයෝජනවලින් ලැබෙන ආදායම.

ගිණුමෙන් කරනු ලබන ගෙවීම්.

9. පහත දැක්වෙන ගෙවීම් ගිණුමෙන් කරනු ලැබිය යුතු ය :—

(අ) අරමුදලේ කාර්ය කරගෙන යෑම සඳහා අවශ්‍ය වන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන සියලු මුදල් ;

(ආ) මණ්ඩලයේ බලතල පාවිච්චි කිරීමේ දී කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරනු ලැබූ වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් ; සහ

(ඇ) මණ්ඩලයේ නිලධරයන්ට හා සේවකයන්ට වැටුප් හා වෙනත් පඩිනඩි ගෙවීමේ දී මණ්ඩලය විසින් දරනු ලැබූ සියලු වියදම්.

අරමුදලේ මුදල් ආයෝජනය කිරීම.

10. අරමුදලට අයත් යම් මුදලක් ජනාධිපතිවරයා විසින් දෙනු ලබන විධානවලට යටත්ව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට ආයෝජනය කරනු ලැබිය හැකි ය.

අරමුදලේ නිලධරයන් සහ සේවකයන්.

11. ජනාධිපතිවරයාගේ විධානවලට යටත්ව, පහත සඳහන් බලතල මණ්ඩලය සතු වේ:—

(අ) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම ;

(ආ) එසේ පත් කරනු ලැබූ නිලධරයන් සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම ; සහ

(ඇ) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීමේ දී දරන ලද පාරිශ්‍රමික සහ වෙනත් වියදම් අරමුදලේ ආදායමෙන් ගෙවීම.

ගිණුම් විගණනය කිරීම.

12. (1) අරමුදලේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තැබීමට මණ්ඩලය කටයුතු සැලසිය යුතු ය.

(2) මණ්ඩලයේ සෑම වර්ෂයකම ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය. එසේ ගිණුම් විගණනය කිරීමේ දී තමන්ට සහායවීම පිණිස තමන්ගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කරන සුදුසුකම් ලත් යම් විගණකවරයකුගේ සේවය විගණකාධිපතිවරයා විසින් ලබාගනු ලැබිය හැකි ය.

(3) අරමුදලේ ගිණුම් විගණනය කිරීමේ ලා විගණකාධිපතිවරයා විසින් දරනු ලැබූ වියදම් පියවීම පිණිස, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් අරමුදලේ ආදායමෙන් විගණකාධිපතිවරයාට ගෙවිය යුතු ය. විගණකාධිපතිවරයා විසින් ලබා ගනු ලැබූ යම් පාරිශ්‍රමිකයකින් එකී විගණක කටයුතු සඳහා විගණකාධිපතිවරයා විසින් සේවයේ යොදවනු ලැබූ යම් සුදුසුකම් ලත් විගණකවරයකුට හෝ විගණකවරුන්ට ගෙවනු ලැබූ මුදල් අඩු කිරීමෙන් පසු, ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් පසු හැකි තාක් ඉක්මණින් ඒ වර්ෂයේ අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ වාර්තාවක් සහ අරමුදලේ ආදායම හා වියදම පිළිබඳ ප්‍රකාශයක් සහ අරමුදලට අයත් මුදල් ඒ වර්ෂය තුළ දී ආයෝජනය කළ ආකාරය පිළිබඳ ප්‍රකාශයක් විගණකාධිපතිවරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන යෙදුමෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයකුව සිටින්නා වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන්

වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක හේවාසික එක් එක් හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවූ වෙනත් ආයතනයක සාමාජිකයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නා වූද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්

අදහස් වේ.

විගණකාධිපතිවරයාගේ වාර්තාව පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු බව.

**13.** 12 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාර විගණකාධිපතිවරු විසින් පිළියෙල කරන ලද වාර්තාව සහ ප්‍රකාශය මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත යැවිය යුතු අතර, ඒ වාර්තාව සහ ප්‍රකාශය පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට ඒ අමාත්‍යවරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය.

රීති සෑදීමට මණ්ඩලය සතු බලතල.

**14.** මණ්ඩලයේ බලතල පාවිච්චි කිරීමට, කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීමට බලපාන හෝ සම්බන්ධවන හෝ ආනුෂංගික වන කවර වුවද කරුණක් සම්බන්ධයෙන් අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය.

අරමුදලේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් බව.

**15.** අරමුදලේ සියලුම නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතු බව.

**16.** මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

ඇතැම් බදුවලින් නිදහස් කිරීම.

**17.** අරමුදලට මුදලින් හෝ වෙනත් ආකාරයකින් කරනු ලබන සෑම පරිත්‍යාගයක්ම 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා, ආණ්ඩුව විසින් පිහිටුවනු ලැබූ අරමුදලකට මුදලින් හෝ අන්‍යාකාරයකින් කරනු ලැබූ පරිත්‍යාගයක් ලෙසින් සැලකිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"මහ බැංකුව" යන්නෙන් 422 වන අධිකාරය වූ මුදල් නීති පනත මඟින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.